www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# බුද්ධ ප්‍රතිමාවක් ඉදිකිරීම ශ්‍රී ලංකාවේ වාර්ගික ආතතීන් නිර්මානය කරයි

## Erection of Buddha statue produces communal tensions in Sri Lanka

**නන්ද වික්‍රමසිංහ විසිනි**
**2005 ජූනි 9**

මෑත සති කිහිපය තුල ශ්‍රී ලංකාවේ නැගෙනහිර පලාතේ වරාය නගරයක් වන ත්‍රිකුනාමලයේ වර්ධනය වුනු සිද්ධීන් මගින් රට පුරා වාර්ගික ආතතීන් මෙන් ම යලි සිවිල් යුද්ධය කරා ඇද වැටීමේ අන්තරාය ද උත්සන්න කෙරී ඇත.

ක්ෂනික ගිනි පුපුර වූයේ මැයි 15 දා රාත්‍රියේ අන්ධකාරයට මුවා වෙමින් නගර මධ්‍යයේ බුද්ධ ප්‍රතිමාවක් ඉදිකිරීම යි. ත්‍රිකුනාමලයේ ත්‍රී රෝද රියදුරු සංගමය මෙම ප්‍රකෝපකාරි ක්‍රියාවට වගකිව යුතු විය. එහෙත් ත්‍රිකුනාමල ශාසනාරක්ෂක බල මන්ඩලය සහ උතුරු නැගෙනහිර සිංහල සංවිධානය ඇතුලු සෙසු වර්ගවාදී කන්ඩායම් ද එයට සම්බන්ධිත ය.

ත්‍රිකුනාමලය සිංහල, දෙමල හා මුස්ලිම් මිශ්‍ර ජනගහනයකින් යුක්ත ප්‍රදේශයක් වන අතර දශක දෙකක යුද්ධයෙන් මුලුමනින් ම පාහේ විනාශයට පත්ව ඇත. 2002 මුල කාලයේ පටන් මේ දක්වා කොලඹ ආන්ඩුව හා දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානය අතර වඩවඩාත් හෙලත්තාඩු වන සටන් විරාමයක් පැවත තිබේ. නගර මධ්‍යයේ බුද්ධ ප්‍රතිමාවක් ඉදිකිරීම දෙමල ජනයා වෙතින් විරුද්ධත්වය අවුස්සා වාර්ගික මනෝගතීන් අවුලුවාලීමේ එල්ලයෙන් යුතුව ගනන් බලා කරන ලද ක්‍රියාවකි.

අනුප්‍රාප්තික කොලඹ ආන්ඩු වසර ගනනාවක් තිස්සේ වාර්ගික සමතුලිතතාව වෙනස් කිරීමෙත් එල්ටීටීඊයට එරෙහි යුද්ධයට සහයෝගී පදනමක් සපයා ගැනීමේත් විධික්‍රමයක් ලෙස දරිද්‍රතාවට ඇද වැටුනු සිංහල ගැමියන් ප්‍රදේශය තුල පදිංචි කරවා තිබේ. එල්ටීටීඊය ත්‍රිකුනාමලය සලකන්නේ බලය බෙදා ගැනීමේ සැකස්මක් මත කොලඹ ආන්ඩුව සමග සාම ගිවිසුමකට එලඹුන හොත් ප්‍රාදේශීය අගනුවරක් වීමේ විභවයෙන් යුත් නගරයක් ලෙස ය.

බුද්ධ ප්‍රතිමාව ඉදිකල වහා ම ත්‍රිකුනාමල දිස්ත්‍රික් දෙමල ජනතා සභාව එය ඉවත් කරන ලෙස ඉල්ලා මැයි 17 දා නගරය පුරා හර්තාලයක් සංවිධානය කලේ ය. බොහෝ කඩ සාප්පු හා කාර්යාල එදින වසා තැබුනු අතර ප්‍රවාහනය ද ඇනහිටුනි. දෙමල හා සිංහල කල්ලි අතර ගැටුම් හට ගැනුනි. ස්ථාන කිහිපයක ම අත් බෝම්බ පුපුරුවා හැරීමෙන් එක අයෙකු ඝාතනය වී තවත් ගනනාවකට තුවාල සිදු විය. ප්‍රාදේශීය දේශපාලනඥයෙකු පසුව වාර්තා කල පරිදි, අසල පිහිටි සිරිමාපුර ගම්මානයේ දී දෙමල තරුනයෙක් වෙඩි තබා ඝාතනය කර තිබේ.

දෙමල ජනතා සභාව නිල වසයෙන් පැමිනිල්ලක් කිරීමෙන් පසුව, ප්‍රශ්නය "සාමකාමීව විසඳා ගන්නා" ලෙස ත්‍රිකුනාමල මහේස්ත්‍රාත්වරයෙක් නියෝග කලේ ය. එහෙත් කිසිදු එකඟතාවක් ඇති කර ගැනීමට ඔවුහු අපොහොසත් වූහ. හර්තාලය තවත් දින හතරක් තිස්සේ පැවතුනේ තව දුරටත් ප්‍රචන්ඩ ගැටුම්වලට තුඩු දෙමිනි. විවෘතව තැබුනේ සිංහල හා මුස්ලිම් වැසියන්ට අයත් කඩ සාප්පු පමනි. දෙමල ජනතා සභාව වෙසක් උත්සවය වෙනුවෙන් මැයි 22-23 දිනවල සිය උද්ඝෝෂනය නතර කල නමුත් විරෝධතා යලි අරඹන බවට අනතුරු ඇඟවී ය.

මෙම ප්‍රතිමාව දිවයින පුරා සිංහල ස්වෝත්තමවාදීන් රැලි වීමේ ආකර්ෂනීය ධ්‍රැවයක් වී තිබේ. පක්ෂ දෙකක් -- ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ ජාතික හෙල උරුමය -- වර්ගවාදී කැරොල් කරත්තයට වහා ම පැන ගත්හ. මැයි 18 දා පාර්ලිමේන්තුවේ කල කතාවක දී, "පීඩාවට පත්ව සිටින්නේ සිංහල ජනතාව" යැයි ප්‍රකාශ කල ජවිපෙ මන්ත්‍රී විමල් වීරවංශ, "සෑම ආගමක ම අයිතිය තහවුරු කරන" ලෙස ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. පැහැදිලි ඇඟවුම වූයේ බුද්ධ ප්‍රතිමාව සහ "සිංහලයන්ගේ අයිතීන්" ආරක්ෂා කල යුතු ය යන්න ය.

හෙල උරුමය ඊටත් වඩා ඍජු ලෙස සිය ආස්ථානය ප්‍රකාශයට පත් කලේ ය. හෙල උරුමයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරයකු සහ බෞද්ධ භික්ෂුවක වන අතුරලියේ රතන බුද්ධ ප්‍රතිමාව ඉදිකිරීම ආරක්ෂා කරමින් පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයන් දෙකක් සිදු කලේ ය. රතන හෙල උරුමයේ නායක එල්ලාවල මේධානන්ද සමග එක්ව, ප්‍රතිමාව ඉවත් කිරීමටත් සුනාමියෙන් විපතට පත් ජනතාවට ආධාර බෙදා දීම පිනිස එල්ටීටීඊය සමග ඒකාබද්ධ මන්ඩලයක් පිහිටුවීමේ

ආන්ඩුවේ සැලසුම්වලටත් විරුද්ධව මැයි 19 දා කොලඹ නගර මධ්‍යයේ පිටකොටුවේ සත්‍යග්‍රහයකට ද සහභාගි විය.

මේධානන්ද, විරෝධතා අවස්ථාවේ කල කතාවක දී, එල්ටීටීඊයටත් සෙසු දෙමල සංවිධානවලටත් විරුද්ධව රුදුරු වාග් ප්‍රහාරයක් දියත් කලේ ය. ත්‍රිකුනාමලයේ දෙමල කන්ඩායම්වල උද්ඝෝෂනය ප්‍රදේශයෙන් සිංහල වැසියන් පලවා හැරීමේ කුමන්ත්‍රනයක කොටසක් යැයි ඔහු ප්‍රකාශ කලේ ය. එල්ටීටීඊ පාලන ප්‍රදේශවල පිහිටා ඇතැයි කියනු ලබන "ගුවන් පථයක්" විනාශ කරන ලෙස හෙල උරුමය නායකයා ආන්ඩුවෙන් ඉල්ලා සිටියේ ය. මෙය පැහැදිලි යුද ක්‍රියාමාර්ගයක් වනු ඇත. සුනාමි ආධාර බෙදා දීම පිලිබඳ මොන යම් හෝ එකඟතාවකට පෙරාතුව එල්ටීටීඊය සිය ආයුධ අතහැරිය යුතු බව ද ඔහු ඉල්ලී ය.

ත්‍රිකුනාමලයේ ආතතීන් උත්සන්න වෙමින් පවතිද්දී, වැඩි පුර භටයන් අවශ්‍ය යැයි හමුදාව කල ඉල්ලීමකට ප්‍රතිචාර වසයෙන් ආරක්ෂක ලේකම් අශෝක ජයවර්ධන මැයි 21 දා ප්‍රදේශයේ සංචාරයක යෙදුනි. ආරක්ෂාව තර කරන ලෙසත් සියලු රාජ්‍ය ආයතන, බැංකු සහ කඩ සාප්පු විවෘතව තබන ලෙසත් ඔහු අන කලේ ය. ඉන් පසුව මිලිටරිය අධි-ආරක්ෂක කලාප හතරක් වෙන් කොට නගරයේ මුර කපොලු ශක්තිමත් කොට තිබේ. ප්‍රතිමාවට ප්‍රහාරයක් එල්ල වීමට ඉඩ ඇතැයි යන කඩතුරාව යටතේ, හමුදාව මැයි 25 දා එම ස්ථානය වටා කටු කම්බි වැටක් ඉදි කොට එය ආරක්ෂා කිරීමට සොල්දාදුවන් ද යොදවා ඇත.

මැයි 29 දා, ශාසනාරක්ෂක බල මන්ඩලය සහ උතුරු නැගෙනහිර සිංහල සංවිධානය, කොලඹ පැවති ප්‍රවෘත්ති සම්මන්ත්‍රනයක දි තව දුරටත් ආතතීන් අවුලුවාලී ය. ප්‍රතිමාව ඉවත් කෙරෙනු ඇත්තේ සිය මල මිනිය මතින් පමනක් යැයි ප්‍රකාශ කල ශාසනාරක්ෂක බල මන්ඩලයේ නායක දෙහිඕවිට පියතිස්ස, ආන්ඩුව දෙමල විරෝධතාකරුවන් මැඩීමට පියවර ගෙන නැත්තේ මන්දැයි විමසී ය.

තවත් භික්ෂුවක වන දේශප්‍රේමී භික්ෂු පෙරමුනේ ලේකම් බෙංගමුවේ නාලක, ත්‍රිකුනාමලයේ බුද්ධ ප්‍රතිමාව ඉවත් කිරීමට කෙරෙන ඉල්ලීම සහ 2001 දී තලිබාන්වරු විසින් ඇෆ්ඝනිස්තානයේ බාමියන්හි පිහිටි ශත වර්ෂ ගනනක් පැරනි ශෛලමය ප්‍රතිමා විනාශ කරනු ලැබීම අතර විකාර සහගත සමාන්තරයක් ඇන්දේ ය.

කොලඹ මාධ්‍ය මෙම වර්ගවාදී උද්ඝෝෂනයට සඵල ලෙස පිටුබලය දී ඇත. මෙයින් අයිලන්ඩ් පුවත් පත් සමූහය විශේෂයෙන් ම ජුගුප්සාජනක ක්‍රියාකලාපයක් ඉටු කරයි. මැයි 29 දා සිංහල භාෂාවෙන් පල වන ඉරිදා දිවයින ත්‍රිකුනාමලයේ බුද්ධ ප්‍රතිමාව ඉදිකිරීම ආරක්ෂා කලේ, එය ඉවත් කිරීම "සිංහල බෞද්ධයන්ගේ මලගම සඳහා සීනු නාද කිරීමක්" වනු ඇතැයි ප්‍රකාශ කරමිනි. දිවයිනේ සිංහල බෞද්ධ ආධිපත්‍යය යුක්තියුක්ත කිරීමට යොදා ගැනෙන ව්‍යාජ සහගත කියාපෑමක් ද එම කතුවැකිය මගින් මතකයට නංවන ලදි: එනම්, ශ්‍රී ලංකාව බුද්ධාගම ආරක්ෂා කරනු ඇතැයි බුදුන් සිය මරන මංචකයේ දී ප්‍රකාශ කල බවයි.

මෙම උද්ඝෝෂනය ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මුහුන දෙන දේශපාලන අසීරුතා සංකීර්න කොට තිබේ. එල්ටීටීඊය සමඟ ඒකාබද්ධ ආධාර යාන්ත්‍රනයක් පිහිටුවව හොත් තමන් ආන්ඩුවෙන් ඉවත් වන බවට පාලක එක්සත් ජනතා නිදහස් සන්ධානයේ (එජනිස) දෙවන විශාලතම පාර්ශ්වකරු වන ජවිපෙ ප්‍රකාශ කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, සභාගය තුල ඝර්ෂනයන් ඇති කරන තවත් හේතුවක් බවට පත් වන, ප්‍රතිමාව අරබයා පවත්නා ආතතීන් සමනය කරගැනීමේ මංමුලා සහගත ප්‍රයත්නයක ජනාධිපතිනිය යෙදී සිටී.

එජනිස ආන්ඩුව "ත්‍රිකුනාමලයේ පවතින ආතති සහගත තත්වය පිලිබඳ සිය උත්සුකතා ප්‍රකාශ කරමින්" සහ "සියලු උත්සුක පාර්ශ්වයන්ට යුක්තිය හා සාධාරනය ඉටු කරන හා නීතියට අනුකූල වන" විසඳුමක් ඉල්ලා සිටිමින් මැයි 25 දා නිවේදනයක් නිකුත් කලේ ය. "බාහිර බලවේග ගනනාවක සහයෝගය ඇතිව" අවුල් ඇති කරන්නේ යැයි එය "කුඩා කන්ඩායම්වලට" බැන වැදුනේ ය.

රාජ්‍ය ඉඩමක ප්‍රතිමාවක් ඉදිකිරීම නීති විරෝධී යැයි ප්‍රකාශ කරන ලෙස ඉල්ලමින්, නීතිපති, ආන්ඩුව වෙනුවෙන්, ත්‍රිකුනාමලයේ දිස්ත්‍රික් අධිකරනයේ ජූනි 1 දා නඩුවක් ගොනු කලේ ය. අධිකරනය ප්‍රශ්නය විසඳාලන තෙක් ප්‍රතිමාවට කිසියම් එකතු කිරීමක් කිරීම වලකාලන නිවැරුම් ආඥාවක් ද එය ඉල්ලා සිටියේ ය. ප්‍රතිමාව ඉදිකිරීම සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන්ට ජූනි 13 දා අධිකරනය ඉදිරියේ පෙනී සිටින ලෙස දිස්ත්‍රික් විනිසුරුවරයා නියෝගයක් නිකුත් කලේ ය.

සිංහල-බෞද්ධ හා දෙමල කන්ඩායම් අතර සම්මුතියක් ඇති කිරීමේ ප්‍රයත්නයක් ලෙස, කුමාරතුංග ජූනි 1 දා දෙවන වතාවට ද අමාත්‍ය මන්ඩල නියෝජිත කන්ඩායමක් ත්‍රිකුනාමලයට යැවුවා ය. එහෙත් එයින් ප්‍රතිඵලයක් නොලැබුනි. සිද්ධියට සම්බන්ධිත විවිධ සිංහල සංවිධාන, ගංගාධාර සංවර්ධන ඇමති මෛත්‍රීපාල සිරිසේනගේ නායකත්වයෙන් යුත් ආන්ඩුවේ නියෝජිත කන්ඩායම හමුවීම පවා ප්‍රතික්ෂේප කලහ.

දෙමල ජනතා සභාවේ නායකයෝ, හින්දු සහ කතෝලික ආගමික නියෝජිතයන් සමග, එම හමුවට සහභාගි වූහ. ත්‍රිකුනාමලයෙන් ආරක්ෂක හමුදාවන් ඉවත් කර ගැනෙනු ඇති බවට සහතිකයක් ලැබීමෙන් අනතුරුව, සිය උද්ඝෝෂනය නතර කිරීමට දෙමල

ජනතා සභාව එකඟ විය. එහෙත් ඒ ජූනි 13 දා ප්‍රශ්නය සම්බන්ධයෙන් අධිකරන නියෝගයක් ලැබෙන තෙක් පමනි. හමුදාවන් නගරයෙන් ඉවත් කර නොගැනීමට විරෝධය පල කරනු පිනිස දෙමල ජාතික සන්ධානය සහ දෙමල ජනතා සභාව පසුගිය සිකුරාදා හර්තාලයක් කැඳවී ය.

විසඳුමක් පෙනෙන්ට නැත. උද්ඝෝෂනයේ නිරතව සිටින සිංහල වර්ගවාදී කන්ඩායම් පෙන්නුම් කර ඇත්තේ තමන් කිසිදු අධිකරන නියෝගයකට බැඳී නැති බව යි. මෙම සංවිධානවලටත් “බෞද්ධ අයිතීන්” පිලිබඳ ඔවුන්ගේ ප්‍රතිගාමී උද්ඝෝෂනයටත් බැරෑරුම්ව අභියෝග කිරීමට කුමාරතුංග සූදානම් නැත. ඒ මක් නිසා ද කිය තොත්, ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, සමස්තයක් ලෙස කොලඹ දේශපාලන සංස්ථාපිතය මෙන් ම, ජවිපෙ හා හෙල උරුමය සේ, වාර්ගික දේශපාලනයේ ගිලී පවතින හෙයිනි.

© www.wsws.org